17 පිටෙන්

එකේ හිටියෙ නැහැ බේබී...
-මට කොහොම හරි තාත්තට කතා කරන්න ඕනෙ සිරිසේන මාමා..." මගේ පපුව ගැහෙන හඬ මටම ඇසෙන්නා සේ ය.
-මහත්තයා වහං වෙලා ඉන්නෙ... හරියට තත්වෙ තේරුම් ගන්න තුරු මහත්තයාට ටිකක් වහං වෙලා ඉන්න කියලා ඉහළින් උපදෙස් ලැබිලා තියෙන්නෙ... ගුරුසිංහ කාරයාත් හැංගිලා කියලයි කියන්නෙ.. මහත්තයා ඉන්න තැන මං වත් දන්නෙ නැහැ..."
-මට කොහොම හරි තාත්තට කතා කරන්න ඕනෙ..." මම කෑගැසුවෙමි.
-බේබී කලබල වෙන්න එපා.... මම කොහොම හරි පණිවිඩයක් යවා ගන්න බලන්නම්...." සිරිසේන මාමා කීවේ මා අස්වසන්නට විය හැකි යයි මම සිතුවෙමි.

Photo: Jagath

එසේ වුව ද දිනකට පසු තාත්තා මට කතා කළේ ය.
-මගේ දුව කලබල වෙන්න එපා...-
තාත්තා බොහෝ සන්සුන් ලෙස කීවේ ය.
-ඇයි කලබල වෙන්න එපා කියන්නෙ...
තාත්තා ඉන්නෙ හරිම අවදානමක කියලා මං දන්නවා... මම ඔහු ගේ කතාව වළකා කීවෙමි.
ඔහු සිනාසුණේ ය.
-දේසපාලනය කියන්නෙ අවදානම් සෙල්ලමක් තමයි මගේ දුව.."
-ඇයි දැන දැන අවදානමට වැටෙන්නෙ...? තාත්තට කරදරයක් වුණොත් මම කොහොමද ඉවසන්නෙ..?"
-අපි මේ අවදානම ගන්නේ මිනිස්සු වෙනුවෙන් පුතා..ඒ රට වෙනුවෙන්..." ඔහු සැමදා කියන කතාව කීවේ ය.

-දේසපාලනය කරන අනිත් අයට පුලුවන් නම් තමන්ගෙ පාඩුවෙ ඉන්න තාත්තට විතරක් බැරි ඇයි...?"
-දේසපාලනය කරන හුගක් අය තමන්ගෙ පාඩුවෙ සල්ලි ගොඩ ගහමින් ඉන්න බව ඇත්තයි... ඒත් මගේ දුව මං දේසපාලනේට ආවෙ ඒකට නෙවෙයි නෙ... මං ආවෙ යම් අරමුණක් වෙනුවෙන්... මං ඒ අරමුණ ඉස්ඨ කර ගන්නවා.... ඒ ගමනෙදි මගේ පීවිතේ අවදානමේ බව දැන දැන තමයි මං මේ වැඩේ කරන්නෙ... කවුරු හරි ඒ අවදානම ගන්න ඕනෙ දුව... අපි හැමෝම ඇස් වහගෙ හිටියොත් මේවා හැමදාම සිදු වේවි..."
මම තාත්තා සමග තර්ක කරන්නට නොයන්නෙමි. ඔහු නිවැරදි බව මම දනිමි. එනමුදු මුළු රටක වැරදි වෙනුවෙන් මගේ තාත්තා බිලි දිය හැකි බවක් මට නොපෙනෙයි. ඔහු කරන්නේ හුදකලා සටනක් පමණක් බව මට වැටහෙයි. මේ සටනින් ඔහු බිම වැටුණ විට ඔහු වෙනුවෙන් ඉදිරිපත් වන්නට කිසිවකු නැති බව මම දනිමි. ඔදාට අද ඔහු වටා සිටින සෙන්පතියන් වහා ඔහුගෙන් ඉවත්ව ආරක්ෂක ස්ථාන කරා පසු බසින බව ස්ථිර ය.

මේ සැතපුම් දහස් ගණනක් දුර බැහැර සිට මට කළ හැකි දෙයක් නැත . මම සිත හදා ගන්නට උත්සාහ ගත්තෙමි. එහෙත් සිත මහත් සේ චංචල වී ඇත. මගේ සසල වූ සිත රාත්‍රියේ නින්ද පවා මට අහිමි කළේ ය. මම නිදිවර්පිත රෑ ගණනාවක් ගෙවමින් සිටියෙමි.

රාත්‍රියට ගේ පුරා ඇසෙන පා හඬ ත් කසු කුසු හඬ ත් දැන් මට අමුත්තක් නොවේ. නිදි පෙති බී නිදා ගන්නා අම්මා නොදන්නා බොහෝ දේ අවදිව සිටින මම දනිමි. මේ ජුගුප්සාජනක පරිසරය තුළ අවදිව සිටින්නට සිදුවීම මහත් පාපයකි. මම හිසේ සිට දෙපා දක්වා පොරවා ගෙන ඇස් පියා ගන්නෙමි. එවිට මේ අප්‍රසන්න පරිසරයෙන් මා වෙන්ව සිටින බවක් යන්තමින් මට දැනෙයි.
රෑ එකේ කණිසම වැදී දැන් විනාඩි කීපයක් ගෙවී ඇත. කිසිවකු මගේ කාමරයේ දොර අසළ සිටින්නේ යයි මට ඉවෙන් මෙන් දැනෙයි. මම ඇහුම් කන් දුන්නෙමි. දොර සෙමින් විවර වන හඬ මට පැහැදිළිව ඇසුණි. මම නොසෙල්වී සිටියෙමි. දොර නැවත වැසෙන හඬත් කිසිවකු මගේ ඇඳ වෙත එන හඬත් මට ඇසුණි. පමා වන්නට වේලාවක් නැති මගේ සිත මොරගා කීවේ ය. මම එක් වරම ඇඳෙන් බිමට පැන්නෙමි. ඇතුල් වූ තැනැත්තා මගෙන් එවන් ප්‍රතික්‍රියාවක් බලාපොරොත්තු වන්නට නැත. මම එක් වරම ඔහුගේ දැඩි ග්‍රහණයට හසු වුණෙමි.

-කෑ ගහන්න එපා...." කෞෂි පහත් එහෙත් අකරුණාවන්ත හඬ ජයසිරි අංකල්ගේ බව මම හඳුනා ගත්තෙමි.

-අත ඇරපන්...." මම කෑ ගසන්නට උත්සාහ කළෙමි.
-කෑ ගහන්න එපා.." ඔහු නැවත කීවේ ය.
-අත ඇරපන්...."
මම හැකි වෙර යොදා ඔහු තල්ලු කර දැමුවෙමි. ඔහු විසිවී ගොස් බිත්තියේ වැදී නතර විය. මම අතට අසුවූ මේස ලාම්පුව ගෙන වැරෙන් ඔහුට දමා ගැසුවෙමි. මගේ පහර ඔහු වැදෙන්නට ඇති බව නිසැක ය.
-පර බැල්ලී.... මං බලා ගන්නං..." ඔහු කාමරයෙන් පිට වන අතර කීවේ ය.

මම ඇඳ මතා වාඩි වුණෙමි. තවමත් පපුව ගැහෙයි. දැන් කළ යුත්තේ කුමක් දැයි මට නොවැටහෙයි. කාමාතුරයා නැවත එනු ඇතැයි මගේ සිත මොරගා කියයි. ඉක්මන් විය යුතු ය. මම මගේ ඇඳුම් බෑගය ඇද ගතිමි. අතට අසුවූ මගේ පොත් පත් සියල්ල එතුළට දමා ගත්තෙමි. අල්මාරිය ඇර අතට අසුවූ පළමු ඇඳුම ඇඳ ගත්තෙමි. බෑගයත් ඇදගෙන කාමරයෙන් පිටට ආවෙමි. කිසිවකු බලා සිටිනා බවක් නොපෙනෙයි.
මම ඉදිරි දොර ඇරගෙන පාරට ආවෙමි. රාත්‍රියේ දැඩි සීතල පවා මට ඒ මොහොතේ නොදැනුණි. මම මට හැකි තරම් වේගයෙන් පළා යමින් සිටියෙමි. මම වියරු වැටුණ කලෙක මෙන් පළා යමින් සිටියෙමි. ඉදිරියෙන් කුලී රියක් එනු පෙනෙයි. මම අත දැම්මෙමි. වාහනය නැවතෙත්ම මම පසුපස දොර ඇරගෙන ඇතුළට පැන ගත්තෙමි. ඉන්දියානු පෙනුමැති රියැදුරා පුදුමයෙන් මෙන් මා දෙස බැලුවේ ය.
-කොහෙටද යන්නේ....?" ඔහු ඉංග්‍රීසියෙන් ඇසුවේ ය.
-කොහෙටද යන්නේ...?" මම මගෙන්ම අසා ගත්තෙමි. කොතැන යා යුතු දැයි මම ම නොදැන සිටියෙමි.

-ඉස්සරහට යං.... බයවෙන්න එපා... මා අතේ සල්ලි තියෙනවා..." මම මගේ මුදල් පසුම්බිය ඇර පෙන්වූයෙමි. රියැදුරා වාහනය ඉදිරියට ගත්තේ ය.
විවර ව තිබූ මුදල් පසුම්බිය තුළ තිබූ කුඩා කොළ කැබැල්ල මම දුටුවෙමි. එය බොහෝ කලකට පෙර මංජුල මට දුන් අශේන් ගේ ලිපිනය බව මම හඳුනා ගත්තෙමි.

-මේ එඩ්‍රස් එකට යං..." මම කොළ කැබැල්ල රියැදුරාට දුන්නෙමි.

ප්‍රබන කලාපයට

ජල සම්පත අපට අහිමි වෙයි ද?

සංජීව පොතුපිටියගේ

බළලා මල්ලෙන් එළියට පනින්නේ ඊළඟ අදියර ලෙස අපේ ඇල, දොළ, ගංගා , වැව් පොකුණු වලට පමණක් නොව පුද්ගලික ලිං වලට පවා බලපත්‍ර ගන්නට සිදුවන විට ය.

තව අවුරුදු 20 කට පසු ලෝකයේ ඉතාම දුර්ලභ හා වටිනාම සම්පත විය හැක්කේ කුමක් දැයි යමෙකු ඔබෙන් ඇසුවහොත් ඔබේ පිළිතුර කුමක් වේද? ඕනෑසෘම බුද්ධිමත් මිනිසෙකුගේ පිළිතුර ජලය යන්න වනවාට කිසිදු සැකයක් නොමැත.

අපේ සිරිලක් මෑණියෝ මෙම මහඟු සම්පතින් අනූන වූ පින් බිමක් වන්නාහ. මේ පින් භූමිය හා එහි සම්පත් ඉටහිර ආර්ථික බලවතුනට උගද් කර අවසානයේ කුණු කොල්ලයට විකුණා දැමීමේ මහත් වූ නින්දිත ක්‍රියාවලියක අප රටේ නපුංසක දේශපාලකයෝ අද දින යෙදී සිටිති.
මුළු ලෝකයේම ආර්ථික බලවතා ලෙස තවමත් වැජඹේන, වර්තමානයේ ලෝක පොලිස්කාරයාගේ වරිතය රඟපානා අමෙරිකා එක්සත් ජනපදය කිඹුල් කඳුළු හලමින් අපේ ජල සම්පත ආරක්ෂා කරන්නට ප්‍රතිපත්ති මාලාවක් 1997 දී එළි දැක්වී ය. එය වාරිමාර්ග කළමණාකරන ප්‍රතිපත්ති සහයෝගිතා ක්‍රියාකාරීත්වය :ෂඑජී" නම් විය. මෙය වචනාර්ථයෙන් හා එහි අරමුණු අතින් ගෙන බැලූ විට ඇමරිකානු රජය මේ කරන්නට සැරසෙන්නේ කවර නම් සත් ක්‍රියාවක් දැයි කෙනෙකුට සිතෙනු ඇත. මන්ද යත් අපේ ජල සම්පත රැක දෙන්නට අවශ්‍ය ප්‍රාග්ධනය, තාක්ෂණ ශිල්පීය දැනුම හා කළමණාකරණ විශේෂඥ උපදෙස් අපට මෙම ප්‍රතිපත්තිය යටතේ ලබාදීමට සැළසුම් කර ඇති බැවිනි.ඉදින් මෙයට විරුද්ධ වනනේ උන්මන්තකයිව් පමණක් යයි කෙනෙකුට බැලූ බැල්මට පෙනී යනු ඇත. එහෙත් යම් තරමින් හෝ විචාර බුද්දියක් ඇති අයෙකුට විමර්ශණාත්මකව ඇමරිකානු ප්‍රතිපත්තිය දෙස බැලීමේදී පැහැදිළිව පෙනෙන දෙයක් ඇත. එනම් අමෙරිකානුවා කිසි දිනෙකවත් ඩොලරයක් ප්‍රතිලාභ ලෙස නොලැබෙන්නේ නම් ශතයක් වියදම් නොකරන බවය. එය හරියටම අපේ සිංහල ගැමි ව්‍යවහාරය අනුව මීයක් කඩන්නේ අත ලෙවකන්නට නොවේ ය යන්නට සමානය.

මෙතරම් වූ ධනයක් වියදම් කොට අපේ ජල සම්පත කළමණාකරණය කරන්නට අමෙරිකාව වළිකන්නේ අප ගැන ඔවුනගේ හද තුළ කැකෑරෙන මහත් වූ දාරක ප්‍රේමයෙන් විය යුතු ය. කිසි දිනෙකවත් නැත. බළලා මල්ලෙන් එළියට පනින්නේ ඊළඟ අදියර ලෙස අපේ ඇල, දොළ, ගංගා , වැව් පොකුණු වලට පමණක් නොව පුද්ගලික ලිං වලට පවා බලපත්‍ර ගන්නට සිදුවන විට ය. ඉන්පසු ඒවාට මීටර සවිකර බෙදාහැරීම කරනු ලබන්නේ ජල අධිකාරියේ අධීක්ෂණය යටතේ ය. එන පොට හොඳ නැත. ගොනා හැරෙන්නේ පොල් පැලය කන්නට බව දැන් වැටහී යා යුතු ය.
මේ බලපත්‍ර වල හිමිකම් ඕනෑම අවස්ථාවක ඕනෑම කෙනෙකුට පැවරිය හැකි ගණයේ ඒවා නිසා අවසානයේ ඒවා මිලදී ගැනීමේ හා විකිණීමේ ශක්‍යතාවයෙන් යුක්තය. අතමිට හිඟ වූ විට අදිවතත් විකුණාගෙන කත අපේ මිනිසුන් ගැන අමුතුවෙන් කිය යුතු නොවේ. ඇමරිකානුවා මෙය මැනැවින් දනියි. ඔවුන් පහර ගසන්නේ හරියටම ගැසිය යුතු තැනටය. අවසානයේ අපේ පුද්ගලික ලිං වල අයිතිය ඇමරිකානු බහු ජාතික සමාගම් වලට නතු වීමට අවුරුදු පමක් වත් ගත නොවනු ඇත. මේ සියලු ජල සම්පත් වල අයිතිය ලබා ගැනීම ඔවුන්ගේ දිගු කාලීන සැළැස්සම බව සහතිකය. අනෙක් අතට ඉන්පසු අප උපන් බිමේ ගංගාවක ඇබල දොළක බැස නා ප්‍රීති වීමේ අවස්ථාවද ඇහිරී යනු ඇත. ගොනුන් වැනි සතුන් නැවීම ද තහනම් වනු ඇත.
මේ ජල කොල්ලයට ඉත සිතින් ආශිර්වාද කරන්නේ අප රටේ බඩගෝස්තරවාදී දේශපාලක පුබ්බඩයන් හා සුද්දා හදන ඕනෑම මස්ත බාල්දු සැළැස්මක් ඉස්තරම් සැළසුම් ලෙස ඉස් මුදුනින් පිළිගන්නේ අපේ සමහර නිලධාරීන් පිරිසකුත් පමණකි. මෙවන් නිළධාරීහු රටේ අහිංසක ජනතාවගේ බදු මුදලින් නිදහස් අධ්‍යාපනය ලබා අවසානයේ එම ජනතාවටම කෙළින්නට මාන බලනා කුහකයියෝ වෙති.ඔවුහු රටට සංස්කෘතියට ගැළපෙන ලෙස කාලෝචිත ප්‍රතිපත්ති හා සැළසුම් සකස් කරන්නට වෙහෙසෙනවා වෙනුවට ශීත කාමර වල මහේශාඛ්‍ය ලීලාවෙන් වැජඹී සුද්දා හදන ඕනෑම සැළසුමකට එක පයින් කැමති වී ලැබෙන ඩොලර් කුට්ටිය සාක්කු වල දමා ගනිති.

ඇමරිකානු ප්‍රමුඛ ව්‍යාපෘතියක් වූ ජාත්‍යන්තර සහල් පර්යේෂණ ආයතනය 1959 දී පිලිපීනයේ පිහිටවූයේ ලෝකයේ වී වගාව, පළිබෝධ නාශක හා පොහොර ආදියෙන් තම ව්‍යාපෘතියට ලාබ උපදවා ගැනීම අරමුණු කරගෙනය. ලෝකයේ සියළු ම ව ප්‍රභේද එක් රැස් කර ජාන කේල් කන්නට මෙයින් ඔවුනට ඉඩ ලැබුණි. මේ ක්‍රියාවලියේ අවසාන ප්‍රතිඵලය වූයේ සම්ප්‍රදායික වී වර්ග තුරන් වී ඒ වෙනුවට ඇමරිකානු සමාගම් විසින් නිෂ්පාදිත නව වී ප්‍රභේද හඳුන්වා දීමයි. ඒවාට සරිලන පොහොර හා කෘෂිරසායන විකිණීමෙන් මහා පරිමාණයෙන් ලාබ ලබන්නට ද ඔවුනට දැන් පොට පෑදී ඇත. ඇමරිකාව ලෝකයේ බත් කන ජනතාව ගොනාට ඇන්දුවේ එලෙස ය. අප දැන් වවන්නේ කන්නේ උන්ට ඕනෑ දේ මිස අපේ පොළොවට සුදුසු අපට උචිත දේ නොවේ. එය සිදවූ අයුරින් ම ශ්‍රී ලංකාවේ ජල කොල්ලය සඳහා අවශ්‍ය පිඹුරුපත් සැකසීමට තෝරාගෙන ඇත්තේ ද ඉඩම් හා මහවැලි අමාත්‍යාංශයේ සිටි නිලධාරීන් පිරිසකි. මේ නිලධාරීහු දැන් ලහි ලහියේ මේ කාර්යයට අවශ්‍ය පසුබිම ජාත්‍යන්තර ජල කළමණාකරණ ආයතනය හරහා සකසමින් සිටිති. ලෝක ජල සංසංදය හා ලංකා ජලනි වැනි එන් ජී ඕ ආයතනද මේ මහා විනාශයට දායක වී සිටින බද පෙනී යයි.
සිදුවන්නට යන දේ වඩාත් පැහැදිළිය. දැන් අවශ්‍යව ඇත්තේ අවදියෙන් සිටීමයි. එසේ නොවුනහොත් සිදු වන්නේ එයා ලංකා සමාගම එවකට සිටි විෂය භාර ඇමතිවරයාවත් නොදැන අරාබියේ එමිරේට්ස් ආයතනයට විකුණුවා සේ හෙට අපේ ගංගා වැව් පොකුණු ටින ද කාට හෝ විකිණී යනු බලා සිටින්නටය. රටේ සම්පත් කොල්ලයට අවශ්‍ය පසුබිම සකසන මුග්ධ දේශපාලනයට එරෙහිව නැගී සිටින්නට කාලය දැන් උදා වී ඇත.

■